අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

# සංස්කෘත

12 සහ 13 ශ්‍රේණි

## විෂය නිර්දේශය

(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## 01. විෂය හැඳින්වීම.

ඉන්දු - යුරෝපීය ආදී දැනට භාවිතයේ නොමැති භාෂා රාශියක් මළ භාෂා බවට පත් වී ඇත ද පාලි හා සංස්කෘතය, සම්භාව්‍ය භාෂා ගණයට අයත් ජීවමාන භාෂා ලෙස දැනටත් ප්‍රචලිත ව පවතී. පෙරදිග දර්ශනයෙන් මානව ජීවිතයක කේන්ද්‍රීය හර ලෙස නිර්දිෂ්ට **ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ** යන පුරුෂාර්ථ හතර ම විෂයෙහි වෙන් වෙන් ව ගොඩනැගුණු සාහිත්‍ය නිර්මාණයන්ගෙන් සමන්විත පැරණිතම හා එක ම සාහිත්‍යය සංස්කෘත භාෂාගත සාහිත්‍යය යි. සමයාන්තර ධර්ම, දර්ශන, තර්ක, න්‍යාය, විචාරවාද, සිද්ධාන්ත, පුරා විද්‍යාව, ගණිතය, මිනිතය යනාදී අනේකප්‍රකාර විෂය ක්ෂේත්‍ර හා බැඳෙන සමස්ත ඥාන මණ්ඩලයේ රාශීභූත ප්‍රභවස්ථානය ද සංස්කෘත භාෂාව වේ.

සංස්කෘත භාෂාව සඳහා ක්‍රි. පු 4 වන සියවසේ දී පාණීනි විසින් සම්පාදනය කරන ලද අෂ්ටාධ්‍යායී නමැති ව්‍යාකරණ ග්‍රන්ථය තරම් විධිමත් විද්‍යානුකූල ව්‍යාකරණයක් මෙතෙක් කිසිදු භාෂාවකට ලියැ වී නැත. සංස්කෘත භාෂාවේ හෝඩියේ අක්ෂර ගොනු කොට ඇති විධිමත් භාවයත් ශබ්ද නියෝජනයේ පොහොසත් බවත් ගැන සලකා බලන කල, යුරෝපීය භාෂාවන්ගේ දුප්පත් බව ගැන ස්වයං විවේචනයක යෙදෙන සුප්‍රසිද්ධ භාරතීය පඬිවරයකු වන ඒ ඒ මැක්ඩොනල් මෙසේ පවසයි. " **... යුරෝපීයයන් වන අපි විද්‍යාත්මක යුගයක ජීවත් වෙමින්, අපේ භාෂාවල සියලු ශබ්ද නියෝජනය කිරීමට අසමත් වූ හෝඩියක් භාවිත කරමින් සිටිමු "**

විධිමත් ව හදාරන්නේ නම් ඉතා පහසු හා රසවත් ලෙස හැදෑරිය හැකි විෂයකි සංස්කෘත භාෂාව. ලොව ප්‍රචලිත භාෂා අතුරින් ඉතාමත් ම විද්‍යාත්මක භාෂාවක් ලෙස සංස්කෘතය හැඳින්විය හැකි ය. පාරිභාෂික ශබ්දමාලාවන් බොහොමයක් සැකසී ඇත්තේ ද සංස්කෘත ශබ්දවලිනි. අද ලෝකයේ ජාත්‍යන්තර භාෂා විශාරදයෝ, සංස්කෘතය සම්බන්ධීකරණ භාෂාවක් ( link language ) ලෙස ප්‍රකාශයට පත් කිරීමේ යෝග්‍ය භාවය ගැන සලකා බලමින් සිටිති. මෑතක දී Pathfinder අජටාකාශ යානයෙන් චන්ද්‍රයා වෙත යවන ලද භාෂා දෙතිසෙන් (32) දෙවන භාෂාව වූයේ සංස්කෘතය බව බොහෝ දෙනෙක් නොදනිති.

සංස්කෘතය පෙරදිග සාහිත්‍යය, කලා ශිල්ප, විද්‍යාව ආදි ඥාන සම්භාරයෙන් පිරි කෝෂ්ඨාගාරයකි. බහුතර වචන සමුදායකින් සිංහල භාෂාව පෝෂණය කරමින් ද, ශිල්ප හා ශාස්ත්‍ර රාශියකට මාධ්‍යය වෙමින් ද, පෙරදිග ලෝකයේ දැවැන්ත සම්භාව්‍ය භාෂාව බවට පත් ව ඇති සංස්කෘත භාෂාව හැදෑරීමෙන් විපුල ඵල නෙළා ගත හැකි වේ.

සංස්කෘත භාෂාව ඉගෙනීම හුදෙක් භාෂාවක් හෝ ශිල්පයක් හැදෑරීමකට වඩා පරිපූර්ණ ශික්ෂණයක් ද විචාර පූර්වක චින්තාවක් ද ප්‍රගතිශීලි නිර්මාණ ශක්තියක් ද උත්පාදනය කරන ඥානාවේශයක් වේ. ඥාන මණ්ඩලයේ නිම්වළලු පුළුල් කරන සංස්කෘත භාෂා සාහිත්‍ය අධ්‍යයනය පරිපූර්ණ නිර්මාණශීලී ප්‍රජාවක් බිහි වීමට හේතු වනු ඇත.

02. විෂයයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණමාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පහසු වීම.

02. සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම.

03. විවිධ දර්ශන, කලා ශිල්ප, ශාස්ත්‍ර විද්‍යාවන් හැදෑරීමට උපස්තම්භක වීම.

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම.

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම.

06. පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම.

07. සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම.

08. හරධර්ම චරිතායනයට සහාය වීම.

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම.

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය.

## අ. පො. ස. (උසස් පෙළ) සංස්කෘත විෂය

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | I | 1.1, 1.2, 1.3, 1.4, 2.1, 2.2, 2.3, 2.4, 2.5, 2.6, 2.8, 2.9, 3.1, 3.2, 6.1, 10.3 | 100 |
| | II | 2.7, 4.1, 4.2, 5.1, 5.2, 6.2, 6.3, 6.4, 6.5, 7.1, 7.2 | 100 |
| | III | 8.1, 8.2, 9.1, 9.2, 10.1, 10.2, 10.4, 10.5 | 100 |
| 13 | I | 1.1, 1.2, 1.3, 1.4, 2.1, 2.2, 2.5, 2.6, 2.7, 3.1, 3.2 | 100 |
| | II | 2.4, 2.8, 2.9, 4.1, 4.2, 5.1, 5.2, 6.1, 6.2, 6.3, 7.1, 7.2 | 100 |
| | III | 6.4, 6.6, 7.1, 7.2, 9.1, 9.2, 10.1, 10.2, 10.3, 10.4, 10.5 | 100 |

## 3.0 අ. පො. ස. (උසස් පෙළ) සංස්කෘත විෂය නිර්දේශය

**12 වන ශ්‍රේණිය**

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.0 වර්ණමාලාව නිවැරදි ව හඳුනාගෙන ලියයි | 1.1 සිංහල හා සංස්කෘත වර්ණමාලා දෙකේ මූලික සමතා හා විෂමතා හඳුනාගනී. | • සිංහල අක්ෂර මාලාව හා සංස්කෘත අක්ෂර මාලාව සිංහල අක්ෂර භාවිතයෙන් | 04 |
| | 1.2 දේවනාගරී අක්ෂර ඇසුරින් ස්වර හා ව්‍යඤ්ජන වෙන් කොට හඳුනාගනී. | • දේවනාගරී ආශ්‍රයෙන් වර්ණමාලාව ලිවීම හා වර්ග කිරීම (ස්වරඃ- හ්‍රස්ව, දීර්ඝ හා සන්ධ්‍යක්ෂර, ව්‍යඤ්ජනඃ- වර්ගාක්ෂර අන්තඃස්ථාක්ෂර, ඌෂ්මන් අක්ෂර, අනුස්වාර, විසර්ග හා අනුනාසිකාක්ෂර, ඝෝෂ අඝෝෂ, අල්පප්‍රාණ .මහාප්‍රාණ ආදිය) | 08 |
| | 1.3 ව්‍යඤ්ජන හා ස්වර සංයෝගය, ස්වරාරෝපණය හා සංයුක්තාක්ෂර හඳුනාගනී. | • ව්‍යඤ්ජනාක්ෂර හා ස්වර සංයෝගය ස්වරාරෝපණය (විවිධ පිළි භාවිතය) හා විවිධ සංයුත්තාක්ෂර | 04 |
| | 1.4 ව්‍යවහාරයේ ඇති සංස්කෘත වචන දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලියයි. | • නිතර භාවිත වන සංස්කෘත වචන දේවනාගරී අක්ෂරයෙන් ලිවීම. | 04 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 2.0 භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි. | 2.1 පද වර්ග හඳුනාගනී. | • නාම (නාම විශේෂණ ඇතුළත් ව) ක්‍රියා (ක්‍රියා විශේෂණ ඇතුළත් ව) නිපාත සහ උපසර්ග වර්ගීකරණයන්. | 04 |
| | 2.2 පද යෝජනය හඳුනාගනී. | | |
| | 2.3 ලිංග, විභක්ති සහ කාරක හඳුනාගනී. | • පුරුෂ, වචන භේදය සහ ප්‍රථමා, ආලපන, ද්විතියා විභක්ති භේදය, උක්තාඛ්‍යාත සම්බන්ධය හා කර්තෘකාරක වාක්‍යයක කර්මය යෙදීම. ලිඞ්ගත්‍රය හා ඊට අදාළ ශබ්ද කිහිපයක්, තෘතීයා, චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී සහ සප්තමී විභක්ති. | 08 |
| | 2.4 සන්ධි වර්ගීකරණය කරයි. විවිධ සන්ධි විශ්ලේෂණය කරයි. අනිවාර්ය සංශ්ලේෂණ හඳුනා ගනියි, භාවිත කරයි. භාවිතයෙන් ලියයි. | • බාහිර අභ්‍යන්තර සන්ධි හා ස්වර ව්‍යඤ්ජන, විසර්ග සන්ධි ප්‍රභේදයන්, සන්ධි කාර්යයන් හා සන්ධි ප්‍රයෝජන. | 10 |
| | 2.5 ධාතුගණ හා ලකාර (ආඛ්‍යාත) හඳුනාගනියි. | • ධාතුගණ 1, 4, 6, 10 හා සාර්වධාතුක ලකාර. | 14 |
| | 2.6 තද්ධිත හා කෘදන්ත හඳුනාගනී භාවිත කරයි. | • තද්ධිත හා කෘදන්ත හඳුන්වා දීම | 08 |
| | 2.7 සමාස හඳුනාගනී, භාවිත කරයි. | • සමාස පිළිබඳ මූලික දැනුමක් ලබා ගෙන භාවිත කිරීම | 10 |
| | 2.8 ප්‍රත්‍යාර්ථක්‍රියා හඳුනාගනී, භාවිත කරයි. | • ප්‍රත්‍යාර්ථ ක්‍රියා හඳුන්වාදීම | 05 |
| | 2.9 අව්‍යයපද හඳුනාගනී, භාවිත කරයි. | • විවිධ අව්‍යයපද, තුමන්ත හා පූර්වක්‍රියා ඇතුළු ව. | 05 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 3.0 කියවා අර්ථය අවබෝධ කර ගනියි. | 3.1 සරල ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කර ගනියි.<br>3.2 සරල පද්‍ය පාඨ හා ගද්‍ය පද්‍ය මිශ්‍ර පාඨ කියවා අර්ථය අවබෝධ කරගනියි. | • බාලාදර්ශ, ප්‍රථමාදර්ශ, ද්විතියාදර්ශ කෘතිවලින් තෝරාගත් කොටස්<br>• ව්‍යාසකාරය, හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය මහාභාරතය, රාමායණය, ආදී කෘතිවලින් තෝරාගත් පාඨ | 09<br>09 |
| 4.0 සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි. | 4.1 සාහිත්‍යාත්මක නිර්මාණයක ලක්ෂණ හඳුනාගනියි.<br>4.2 සාහිත්‍යාත්මක පාඨයක රසය විඳ ගනියි ප්‍රකාශ කරයි. | • බාලාදර්ශ, ප්‍රථමාදර්ශ, ද්විතියාදර්ශ කෘතිවලින් තෝරාගත් කොටස්<br>• ව්‍යාසකාරය, හිතෝපදේශය, පංචතන්ත්‍රය, මහාභාරත, රාමායණ ආදී කෘතිවලින් තෝරාගත් පාඨ | 08<br>08 |
| 5.0 භාෂා සාහිත්‍යය තුළ අන්තර්ගත හර ධර්ම චරිතායනය කරයි. | 5.1 පාඨයක අන්තර්ගත හර ධර්ම හඳුනාගනියි ප්‍රකාශ කරයි.<br>5.2 හර ධර්ම අගයයි චරිතායනය කරයි. | • බාලාදර්ශ, ප්‍රථමාදර්ශ, ද්විතියාදර්ශ කෘතිවලින් තෝරාගත් කොටස්<br>• ව්‍යාසකාරය, හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය මහාභාරතය, රාමායණය ආදී කෘතිවලින් තෝරාගත් පාඨ | 08<br>08 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 6.0 නිරවුල් ව හා පැහැදිලිව භාෂණයේ යෙදෙයි. | 6.1 සරල ප්‍රශ්න අසයි. | • දෛනික සිදුවීම් පිළිබඳ | 06 |
| | 6.2 ප්‍රශ්නවලට පිළිතුරු දෙයි. | • දෛනික සිදුවීම් පිළිබඳ | 06 |
| | 6.3 සරල උපදෙස් ලබාදෙයි. | • ආචාර සමාචාර පිළිබඳ | 06 |
| | 6.4 සංවාදයේ යෙදෙයි. | • කිසියම් මාතෘකාවක් යටතේ කිහිප දෙනකු සම්බන්ධ වීමෙන් | 05 |
| | 6.5 ශබ්ද නිවැරදි ව උච්චාරණය කරයි. | • ශබ්ද උත්පත්තිස්ථාන අවබෝධ කරගෙන උච්චාරණය කිරීම. | 05 |
| 7..0 සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරදිව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | 7.1 තෝරා ගත් ගද්‍ය හෝ පද්‍ය පාඨවලට සවන් දී අර්ථ අවබෝධ කරගනියි.<br>7.2 තෝරාගත් ගද්‍ය හෝ පද්‍ය පාඨවලට සවන් දී නිවැරදි ව ප්‍රතිචාර දක්වයි. | • හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය, කථාසරිත්සාගර ආදී ග්‍රන්ථවලින් උපුටාගත් කොටස්. | 30 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 8.0 අදාළ සංස්කෘතික එරිසරය හඳුනා ගනියි. | 8.1 ආගමික පරිසරය හඳුනා ගනියි.<br>8.2 අධ්‍යාපනික පසුබිම හඳුනා ගනියි. | • මහාභාරතය, රාමායණය, කඨෝපනිෂද් ඇසුරින් වීරකාව්‍ය හා උපනිෂද් සාහිත්‍යය පිළිබඳ සරල දැනුමක් ලබාදීම.<br>(වෛදික සාහිත්‍යය/කාව්‍ය සාහිත්‍යය :- ජයදේව තිලකසිරි) | 40 |
| 9.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 9.1 සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට නිවැරදි අර්ථය ලැබෙන සේ පරිවර්තනය කරයි. | • බාලාදර්ශ, සුරභාරතී, ප්‍රථමාදර්ශ, සංස්කෘත ශික්‍ෂක (එම්. එච්. එෆ්. ජයසූරිය), සරල සංස්කෘත ශික්‍ෂක (බලංගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමි), සංස්කෘත ප්‍රථම පුස්තකය (ආර්. භණ්ඩාර්කර්), සංස්කෘත පාඨමාලා යන ග්‍රන්ථවලින් උපුටාගත් කොටස්. | 20 |
| | 9.2 මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කරයි. | • සංස්කෘත ශික්‍ෂක ෂ, සරල සංස්කෘත ශික්‍ෂක ෂ, සංස්කෘත ප්‍රථම පුස්තකය, ඇසුරෙන් තෝරාගත් සිංහල වාක්‍ය හා මාධ්‍ය භාෂාවෙන් නිර්මාණය කරගත් සරල වාක්‍ය ඡේද. | 20 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 10.0 සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ අවබෝධය ලබාගනියි. | 10.1 වෛදික සාහිත්‍යය පිළිබඳ ව සරල අවබෝධයක් ලබාගනියි. | • ඍග්, යජුර්, සාමන්, අථර්වන් සංහිතා, සහ ආරණ්‍යක, උපනිෂද් හා පුරාණ යන ග්‍රන්ථ පිළිබඳ ව සරල දැනුමක්. (වෛදික සාහිත්‍ය ඉතිහාසය :- ජයදේව තිලකසිරි) | 04 |
| | 10.2 වීරකාව්‍ය සාහිත්‍යය හඳුනාගනියි. | • රාමායණ හා මහාභාරත යන කෘතිවල කර්තෘ, කාල, අන්තර්ගතය හා සුවිශේෂතා. | 03 |
| | 10.3 සංස්කෘත මහාකාව්‍ය ලක්ෂණ හඳුනාගනියි. | • පූර්ව කාලිදාස යුගයේ හා පශ්චාත් කාලිදාස යුගයේ මහාකාව්‍ය ලක්ෂණ. | 03 |
| | 10.4 සංස්කෘත මහාකාව්‍ය හඳුනාගනියි. | • අශ්වඝෝෂ මහ කවියාගේ සිට ශ්‍රී හර්ෂ මහ කවියා දක්වා කතුවරුන්ගේ කෘති හා ඔවුන් ජීවත් වූ කාල වකවානු. | 05 |
| | 10.5 සංස්කෘත ඛණ්ඩකාව්‍ය හඳුනා ගනියි. | • කාලිදාස හා ජයදේව යන කවීන්ගේ ඛණ්ඩකාව්‍ය. | 05 |

13 වන ශ්‍රේණිය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.0 වර්ණමාලාව නිවැරදි ව හඳුනාගෙන ලියයි. | 1.1 මාධ්‍ය භාෂාවට සාපේක්ෂ ව සංස්කෘත වර්ණමාලාවේ විශේෂතා හඳුනාගනියි. | • සංස්කෘත අක්ෂර මාලාව දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලිවීම. | 02 |
| | 1.2 සංස්කෘත වර්ණමාලාව වර්ගීකරණය කරයි. | • දේවනාගරී වර්ණමාලාව වර්ග කිරීම (ස්වර හ්‍රස්ව, දීර්ඝ හා සන්ධ්‍යක්ෂර, ව්‍යඤ්ජන වර්ගාක්ෂර අන්තඃස්ථාක්ෂර, ඌෂ්මන් අක්ෂර, අනුස්වාර, විසර්ග හා අනුනාසිකාක්ෂර, ඝෝෂ. අඝෝෂ, අල්පප්‍රාණ .මහාප්‍රාණ ආදිය | 06 |
| | 1.3 සංකීර්ණ දීර්ඝ සමාස හා විවිධ සංයුක්තාක්ෂර ඇතුළත් ඡේද කියවයි. | • කාදම්බරී, දශකුමාරචරිත යන කෘතිවලින් තෝරා ගත් ඡේද කිහිපයක්. | 03 |
| | 1.4 සංකීර්ණ හා විවිධ සංයුක්තාක්ෂර ඇතුළත් ඡේද කියවන විට ලියයි. | • නිතර භාවිත නොවන සංස්කෘත සංයුක්තාක්ෂර සහිත ඡේද හා වචන දේවනාගරී අක්ෂරයෙන් ලිවීම. | 02 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 2.0 භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි. | 2.1 පද වර්ගීකරණය කරයි. | • නාම (නාම විශේෂණ ඇතුළත් ව) ක්‍රියා (ක්‍රියා විශේෂණ ඇතුළත් ව) නිපාත සහ උපසර්ග යන වර්ගීකරණයන් සවිස්තර ව හැඳින්වීම. | 06 |
| | 2.2 පද යෝජනය වෙන් කොට හඳුනාගෙන භාවිත කරයි. | • උක්තාඛ්‍යාත සම්බන්ධය තවදුරටත්. | 06 |
| | 2.3 ලිංග, විභක්ති, කාරක හා ධාතුවල විවිධතා හඳුනාගනියි. | • හලන්ත, සර්වනාම හා ලිඞ්ගභේදය තවදුරටත් කර්තෘකාරක කර්මකාරක භාවකාරක පරස්මෛපද ආත්මනේපද හා උභයපද හඳුන්වාදීම. | 12 |
| | 2.4 පද සංශ්ලේෂණය හා විශ්ලේෂණය හඳුනාගෙන භාවිත කරයි. | • සංකීර්ණ සන්ධි හා අභ්‍යන්තර සන්ධි | 06 |
| | 2.5 ධාතුගණ හා ලකාර (ආඛ්‍යාත) හඳුනාගනියි. | • ධාතුගණ 2,3,4,7,8,9 හා ආර්ධධාතුක ලකාර. | 20 |
| | 2.6 තද්ධිත හා කෘදන්ත හඳුනාගනී භාවිත කරයි. | • තද්ධිත හා තද්ධිත ප්‍රභේද, කෘදන්ත හා කෘදන්ත ප්‍රභේද. | 10 |
| | 2.7 සමාස හඳුනාගෙන භාවිත කරයි. | • සමාස හා සමාස ප්‍රභේද | 07 |
| | 2.8 ප්‍රත්‍යාර්ථක්‍රියා හඳුනාගෙන භාවිත කරයි. | • ඊප්සාර්ථ ක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා හා අතිශයාර්ථක්‍රියා. | 06 |
| | 2.9 අව්‍යයපද හඳුනාගෙන භාවිත කරයි. | • උපසර්ග හා නිපාත | 03 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 3.0 කියවා අර්ථය අවබෝධ කරගනී. | 3.1 සරල ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කරගනී.<br><br>3.2 සරල පද්‍ය පාඨ හා ගද්‍ය පද්‍ය මිශ්‍ර පාඨ කියවා අර්ථය අවබෝධ කරගනී. | • ද්විතීයාදර්ශ, තෘතියාදර්ශ, කථාසරිත්සාගර, හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර, රත්නාවලී, ප්‍රතිඥායෞගන්ධරායණ සහ ස්වප්නවාසවදත්තා සහ අභිඥානශාකුන්තල ආදී කෘතිවලින් උපුටාගත් පාඨ | 27 |
| 4. සාහිත්‍යය රසාස්වාදයේ යෙදෙයි. | 4.1 සාහිත්‍යාත්මක නිර්මාණයක ලක්ෂණ හඳුනාගනී.<br><br>4.2 සාහිත්‍යාත්මක පාඨයක රසය විඳගනී, ප්‍රකාශ කරයි. | • ද්විතීයාදර්ශ, තෘතියාදර්ශ, කථාසරිත්සාගර, හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර, රත්නාවලී, ප්‍රතිඥායෞගන්ධරායණ සහ ස්වප්නවාසවදත්තා සහ අභිඥානශාකුන්තල ආදී කෘතිවලින් උපුටාගත් පාඨ | 26 |
| 5.0. භාෂා සාහිත්‍යය තුළ අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි. | 5.1 පාඨයක අන්තර්ගත හරධර්ම හඳුනාගනී, ප්‍රකාශ කරයි.<br><br>5.2 හරධර්ම අගයයි, චරිතායනය කරයි. | • නලොපාඛ්‍යානය, ඍතුසංහාර, මේඝදූත, සාවිත්‍ර්‍යුපාඛ්‍යාන, ද්‍රෞපදීස්වයංවර, සෞන්දරනන්ද, චරකසංහිතා, සුශ්‍රුතසංහිතා, අෂ්ටාංගහෘදයසංහිතා, ජානකීහරණ, සද්ධර්මමකරන්ද ආදී කෘතිවලින් උපුටාගත් පාඨ. | 26 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 6.0 නිරවුල් ව හා පැහැදිලිව භාෂණයෙහි යෙදෙයි. | 6.1 ප්‍රශ්න අසයි.<br><br>6.2 ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.<br><br>6.3 උපදෙස් ලබාදෙයි.<br><br>6.4 සංවාදයේ යෙදෙයි.<br><br>6.5 මාතෘකාවකට අදාළ ව කෙටි දෙසුමක් පැවැත්වීමට සමත් වෙයි.<br><br>6.6 භාෂාව ව්‍යක්ත ව භාවිත කරයි. | • උචිත භාෂා ප්‍රයෝග භාවිතයෙන් අදහස් පළ කිරීම.<br><br>• විශේෂ උත්සවයක්, ශිෂ්‍ය සංගමයක්, භාෂා දිනය ආදී අවස්ථාවක දී සංස්කෘත භාෂාව භාවිත කරමින් දේශනයක් පැවැත්වීම. | 12<br><br>10 |
| 7.0 සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරදිව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | 7.1 තෝරා ගත් පද්‍ය හෝ ගද්‍ය පාඨවලට සවන් දී අර්ථ අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.<br><br>7.2 ශ්‍රව්‍ය පට හා ශ්‍රව්‍යදෘශ්‍ය පටවලට සවන් දී අර්ථ අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | • රාමායණ, මහාභාරත ආදී ග්‍රන්ථවලින් උපුටාගත් කොටස්, හඬ පට හා චිත්‍රපට. | 20 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 8.0 අදාළ සංස්කෘතික පරිසරය හඳුනාගනියි. | 8.1 ස්වභාවික පරිසරය හඳුනාගනියි.<br><br>8.2 භාෂාව හා සාහිත්‍යාගත චරිත හඳුනාගනියි. | • විෂයාගත ස්වාභාවික වස්තූන් හඳුනාගැනීම, ඍතුසංහාරය, මේඝදූතය, සෞන්දරනන්ද, ජානකීහරණ, පඤ්චතන්ත්‍ර, හිතෝපදේශ අභිඥානශාකුන්තල. | 30 |
| 9.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 9.1 සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට නිවැරදි අර්ථය ලැබෙන සේ පරිවර්තනය කරයි. | • සුරභාරතී, ද්විතීයාදර්ශ, අභිනවාපාඨාවලී, සරල සංස්කෘත ශික්ෂක II (බලංගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමි), සංස්කෘත ප්‍රථම පුස්තකය (ආර්. භණ්ඩාර්කර්), සංස්කෘත පාඨමාලා I පඤ්චතන්ත්‍ර, හිතෝපදේශ, රාමායණ යන ග්‍රන්ථවලින් උපුටාගත් කොටස් පරිවර්තනය කිරීම. | 15 |
| | 9.2 මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කරයි. | • සරල සංස්කෘත ශික්ෂක II (බලංගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමි), සුරභාරතී (ඩබ්ලිව්. එස්. කරුණාතිලක), සංස්කෘත ශික්ෂක I (එම්. එච්. එෆ්. ජයසූරිය), ආදියේ කොටස් උපුටාගෙන පරිවර්තනය කිරීම භාෂාවට ආවේණික භාෂා ප්‍රයෝග යොදා ගැනීම. | 15 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 10.0 සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ අවබෝධය ලබාගනියි. | 10.1 අශ්වඝෝෂ හිමියන්ගේ, කාලිදාසගේ සහ කුමාරදාසගේ මහාකාව්‍ය කෘති හඳුනාගැනීම. | • බුද්ධචරිත, සෞන්දරනන්ද, කුමාරසම්භව, ජානකීහරණ හා රඝුවංශ යන කෘති පිළිබඳ දැනුමක්. | 06 |
| | 10.2 කාලිදාසයන්ගේ හා ජයදේවයන්ගේ ඛණ්ඩ කාව්‍ය හඳුනාගැනීම. | • ඍතුසංහාර, මේඝදූත, ගීතගෝවින්ද යන කෘති පිළිබඳ දැනුමක්. | 07 |
| | 10.3 ශතක සාහිත්‍යය පිළිබඳ ව දැනුමක් ලබාගැනීම. | • නාමාෂ්ටශතක, නීතිශතක, භක්තිශතක, වෛරාග්‍යශතක, අනුරුද්ධශතක, ශෘංගාරශතක යන ශතක ග්‍රන්ථ පිළිබඳ අවබෝධය. | 07 |
| | 10.4 උපදේශ කථා සාහිත්‍යය පිළිබඳ ව අවබෝධයක් ලබාගැනීම. | • පඤ්චතන්ත්‍ර, හිතෝපදේශ යන කෘතීන්හි කර්තෘ, කාල, අන්තර්ගතය ශෛලිය සහ හරධර්ම. | 07 |
| | 10.5 සංස්කෘත නාට්‍ය සාහිත්‍යය පිළිබඳ ව සාමාන්‍ය දැනුමක් ලබාගැනීම. | • භාස, කාලිදාස, ශ්‍රී හර්ෂ යන කවීන්ගේ නාට්‍ය කෘති. | 07 |

## උසස් පෙළ සංස්කෘත නව නිර්දිෂ්ට ග්‍රන්ථ

01. සුරභාරතී . මහාචාර්ය ඩබ්. එස්. කරුණාතිලක

02. සංස්කෘත ශික්ෂක ප්‍රථම / ද්විතීය පුස්තක . මහාචාර්ය එම්. එච්. එෆ්. ජයසූරිය

03. සංස්කෘත නාමාඛ්‍යාත විවරණ . මහාචාර්ය වරාගොඩ ප්‍රේමරතන හිමි.

04. සරළ සංස්කෘත ශික්ෂක I, II . අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රී නා හිමි

05. ආධුනික සංස්කෘත ව්‍යාකරණය . මැක්ඩොනල්

06. වෛදික සාහිත්‍යය . මහාචාර්ය ජයදේව තිලකසිරි

07. සංස්කෘත කාව්‍ය සාහිත්‍යය . මහාචාර්ය ජයදේව තිලකසිරි

08. සංස්කෘත නාට්‍ය සාහිත්‍යය . මහාචාර්ය ජයදේව තිලකසිරි

09. සංස්කෘත ප්‍රථම පුස්තකතය . ආර් භණ්ඩාර්කර්

10. සංස්කෘත සාහිත්‍ය . ජී. එස්. බී. සේනානායක

11. සංස්කෘත ප්‍රවේශ - පාඨමාලා I, II . සංස්කරණය- ආචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි, ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ, ආචාර්ය කේ. බී. ජයවර්ධන

12. සංස්කෘත ප්‍රවේශ - ගද්‍ය, පද්‍යාවලී I, II . සංස්කරණය- ආචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි, ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ, ආචාර්ය කේ. බී. ජයවර්ධන

13. සංස්කෘත අකුරු ලියමු (1) ග්‍රන්ථය (සංයුක්ත තැටි 2 සමග) - ප්‍රාචීන අධ්‍යයන සඳහා වූ ආයතනය

## 4. 0 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

භාෂා භාවිතයට කෙටි විද්‍යාත්මක හා තර්කානුකූල ක්‍රම යොදා ගැනීම. මේ සඳහා ශ්‍රව්‍ය පට, ශ්‍රව්‍ය දෘශ්‍ය පට, තත්කාලීන ප්‍රකාශන ආදිය යොදා ගනියි.

## 5. 0 පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවිධානය

කණ්ඩායම් සංවාද, සංස්කෘත භාෂා දිනයක් යොදා ගැනීම, මාසික - වාර්ෂික සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය හා ගායනය අදාළ වන පරිදි කෙටි නාට්‍ය සැකසීම සහ ඉදිරිපත් කිරීම, බිත්ති පුවත්පත් පළ කිරීම, පාඩම්වලට සමගාමී තොරතුරු රැස් කිරීම, ආදිය මගින් වැඩසටහන් සකස් කර ගනියි.

## 6. 0 තක්සේරු හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය.

මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2011 වර්ෂයේ දී පැවැත්වේ.

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙන ඇත.